# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/11 – 2018 ජූලි 24 වැනි අඟහරුවාදා – 2018.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

මගේ අංකය: එල්ඩී/05/2004/ඊ/14.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: එන්ජ්එල්/ඩීඑස්/03/ඒඑල්/01.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපණ ආඥාපනතේ (12 වන අධිකාරිය) 18 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම අංක 1974/2 හා 2016.07.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 1ඒ පිටුවේ පළ කරන ලද ''2016 අංක 118 දරන ආඥාව'' සහ ''1981/37 හා 2016.08.23 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලද එහි ශුද්ධි පත්‍රිකාව'' මෙයින් අවලංගු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූලි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 331

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 160 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2004/ඊ/14.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: එන්ජ්එල්/ඩීඑස්/03/ඒඑල්/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූලි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර''
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, නල්ලූර්.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නීරවියාඩි - ජේ / 101 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වන්නාර් පන්නයි ඊසාන (යාපනය නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 23) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක වයිඒ/ජේඑෆ්එෆ්/ 2004/099 හා 2005.02.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 – නයනාදේවන් වලව්, පේතන් වලව් – ප්‍රමාණය: හෙක්. 0.0042**
උතුරට: විද්‍යාල පටුමග සහ සොක්කර වලව්; නැගෙනහිරට: සොක්කර වලව් සහ කැබලි අංක 2; දකුණට: කැබලි අංක 2 සහ කැබලි අංක 3; බටහිරට: කැබලි අංක 3 සහ විද්‍යාල පටුමග.

02. **කැබලි අංක 2 – නයනාදේවන් වලව්, පේතන් වලව්, වරි. අංක 60/6, විද්‍යාල පටුමග – ප්‍රමාණය: හෙක්. 0.0717**
උතුරට: කැබලි අංක 3, කැබලි අංක 1 සහ සොක්කර වලව්; නැගෙනහිරට: සොක්කර වලව් සහ යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය; දකුණට: හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය සහ කැබලි අංක 3; බටහිරට: කැබලි අංක 3.

03. **කැබලි අංක 3 – නයනාදේවන් වලව්, පේතන් වලව්, වරි. අංක 60/5, විද්‍යාල පටුමග – ප්‍රමාණය: හෙක්. 0.0796**
උතුරට: විද්‍යාල පටුමග, කැබලි අංක 1 සහ 2; නැගෙනහිරට: කැබලි අංක 2 සහ යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය; දකුණට: යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය; බටහිරට: යාපනය හින්දු විද්‍යාල ක්‍රීඩා පිටිය සහ විද්‍යාල පටුමග.

08 - 332

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.